# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2024 (2025)

**මෙම විභාගයේදී සෑම විභාග අපේක්ෂකයකුම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (Online) ක්‍රමය මගිනි.**

උක්ත විභාගයට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2024 නොවැම්බර් මස 05 දින සිට 2024 නොවැම්බර් මස 30 වන දින තෙක් භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවෙකුම මෙම නිවේදනය සම්පූර්ණයෙන්ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත මාර්ගගත ආකාරයෙන් (Online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටීමට තෝරා ගත් **නගරය හා විෂයයන්** ඇතුළත් කිරීමේදී නිවැරදිව ම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

### 02. අයදුම්පත්

2.1 මාර්ගගත (Online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව PDF ගොනුවේ මුද්‍රිත පිටපත ලබා ගැනීම අනිවාර්යය වන අතර, අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබා ගත යුතුය. මුද්‍රණය කරගත් පිටපත දෙපාර්තමේන්තුවට එවීම අවශ්‍ය නොවේ.

> රජයේ පාසලක ඉගෙනුම ලබමින් පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.

2.2 2024 නොවැම්බර් 30 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක.

2.3 එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.

### 03. පද්ධතියට ප්‍රවේශවීම හා අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණික උපදෙස්

3.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස, "අපගේ සේවා", යටතේ ඇති, "Exam Information Center" මත Click කිරීම මගින් හෝ,
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

3.2 පළමුව ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකයක් හා දුරකථන අංකයක් ඇතුළත් කර ලියාපදිංචි විය යුතු ය.

3.3 ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් පසුව ඔබට ලැබෙන කෙටි පණිවිඩයෙහි (SMS) සඳහන් කේත අංකය (OTP) භාවිත කර පද්ධතියට ප්‍රවේශ විය යුතු ය.

3.4 උපදෙස් සඳහා "Instructions" ලෙස පෙන්වන බොත්තම (Button) තෝරන්න (Click) තාක්ෂණික උපදෙස්, පොදු උපදෙස් හා උපදෙස් වීඩියෝව නැරඹීමෙන් අනතුරුව "Next" බොත්තම (Button) තෝරා අයදුම්පත සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.

### 04. විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit payment) සිදු කළ හැකිය.

4.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම්, "Payment Method" යටතේ ඇති "Pay by Department of Posts" සබැඳිය තෝරා ගත යුතු ය. **එහිදී ඔබට ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.**

**එම කුවිතාන්සියේ "අ.පො.ස. (සා.පෙළ) 2024(2025) විභාග ගාස්තු" ලෙස පැහැදිලිව සටහන් විය යුතු වේ.**

> **ගෙවීම සාර්ථක වූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය (link) සක්‍රිය කිරීම මගින් අදාළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත (Download) කර ගැනීමට හැකි වේ.**

4.2 බැංකු කාඩ්පත් (Credit/Debit cards) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/debit card" අයිතමය තෝරා ගත යුතුය.

4.3 විෂයන් ගණන අනුව ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 6-9 |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 100/- | 150/- | 200/- | 250/- | 300/- | 350/- |

05. ඔබ තෝරා ගන්නා විෂයයන් හා නගරය ඉතා වැදගත් වේ. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්නතම නගරයේ ඇති විභාග මධ්‍යස්ථානයට යොමු කිරීම සිදුවේ.

06. **ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහාම එම ප්‍රවේශ පත්‍රයේ නම, විෂයය හා මාධ්‍ය සම්බන්ධ සංශෝධනයන් ඇත්නම් එය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කර ගැනීමට පහසුකම් සලසා ඇත.**

07. **සෑම පෞද්ගලික අයදුම්කරුවෙක් ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය ඇතුළත් කළ යුතු අතර, අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය ඇතුළත් නොකළ යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ද ඇතුළත් කළ යුතු ය.**

08. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා හඳුනාගැනීමේ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම විභාගය සඳහා අයදුම් කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම්, "Are you a special needs candidate?" හි Yes යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

10. **විශේෂයෙන් සැලකිය යුතුයි**

10.1 මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක ගාස්තුව වශයෙන් මාරු කිරීම හෝ කරනු නොලැබේ.

10.2 **විභාගයට අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ දත්ත නිවැරදිව ඇතුළත් කළ යුතු ය.**

10.3 දෙවන විෂය කාණ්ඩයට අයත් පහත සඳහන් විෂයයන් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුවේ. මෙම අවශ්‍යතාවය සම්පූර්ණ නොකරන අයදුම්කරුවන්ට ලිඛිත විභාගයට පෙනී සිටිය ද ප්‍රතිඵල නිකුත් කරනු නොලැබේ.

(40) සංගීතය (පෙරදිග)
(41) සංගීතය (අපරදිග)
(42) සංගීතය (කර්ණාටක)
(44) නැටුම් (දේශීය)
(45) නැටුම් (භරත)
(50) නාට්‍ය හා රංග කලාව (සිංහල)
(51) නාට්‍ය හා රංග කලාව (දෙමළ)
(52) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

උක්ත කරුණු සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් විමසීම් සිදු කළ හැකිය.


**විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com**
**දුරකථන අංක : 011-2784208 / 011-2784537/ 011-2785922**

**මාර්ගගත ඒකකය**
**දුරකථන අංක : 011-3671568 / 011-3661122**

**යොමු අංකය : 6/4/OL/2024**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503, කොළඹ.**
**2024.11.04**

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
**විභාග කොමසාරිස් ජනරාල්**

# Department of Examinations, Sri Lanka

## General Certificate of Education (Ordinary Level) Examination - 2024 (2025)

### All applicants should submit applications for this examination online

Applications of private candidates for the above examination will be accepted from 05th November 2024 to 30th November 2024. Each private candidate is advised to read this notification completely and understand thoroughly before filling and submitting the application online. Special attention should be paid to enter the selected **Town and Subjects** of the examination accurately.

**2. Applications**

2.1 **After completing the application online, it is mandatory to keep a printed copy of the PDF file safely in possession,** if needed for later submission. **It is not required to send the printed copy to the Department.**

**Applying as private candidate while studying in a public school is prohibited. If revealed any appearance as such would cause to forbid the results of the examination.**

2.2 You will not be able to apply for this examination after 12.00 midnight on 30th November 2024.

**2..3 A candidate should submit one application only. Submitting more than one application will cause to reject all applications of the candidate and actions will be taken against such candidates according to the law. Any revelation of such fraudulent incidents even after issuing of result will cause to invalidate results of such candidates and legal actions will be taken.**

3. **Technical instructions to log in to the system and to fill the application.**

3.1. Following paths of the Department of Examinations, Sri Lanka can be used to fill the application.

- Through the official website https://donets.lk and click "Exam Information Center" under Our Services
- Through https://onlineexams.gov.lk/eic

3.2. Enter your name, National Identity Card Number and Telephone Number for registration.

3.3. When the National Identity Card Number is entered, you will receive a Code Number (OTP) via SMS and use the Code Number to log in to the system.

3.4. Click "instruction" button for instructions. Watch technical instructions, general instructions and the instruction video, then select "Next" button to initiate completing the application.

4. **Payment of Examination fee and downloading the application**

Examination fee can be made via post offices or bank cards (as credit/debit payments)

4.1. If you pay via post office, you should select the link "pay by Department of Posts" under "Payment Method". **The Reference Number you receive therein should be submitted to the Post Office for paying examination fees and the receipt received from the Post Office should be kept in your possession.**

**The receipt should clearly indicate as the payment of "Examination Fee for G.C.E.(O/L) 2024 (2025).**

**When the payment is successfully made, the application can be downloaded by visiting the website through the link sent to you along with the SMS.**

4.2. If you pay by bank credit/debit cards, you should select "Pay by Credit/Debit Card" under "Payment Method"

4.3 Examination fee according to the number of subjects

| No.of Subject | 1 | 2 | 3 | 4 | 5 | 6-9 |
|---|---|---|---|---|---|---|
| Examination Fee (Rs.) | 100/= | 150/= | 200/= | 250/= | 300/= | 350/= |

5. The subjects and town you have selected are very important. If a sufficient number of applicants is not available to establish an examination center in a particular town, you will be directed to an examination center established in a nearest town.

6. If any revisions to be made to the name, subjects and medium cited in the Admission Card, the facility will be provided to do so online immediately after receipt of the Admission Card.

7. **Each private applicant should mention their permanent address and should not mention the name and address of the private or International School where the applicant is receiving education. Private telephone number also should be mentioned.**

8. **Verification of Identity**

It is mandatory to provide the National Identity Card or valid Passport or a valid Driving License at the examination hall to prove identity of the candidate. The identity card should be provided to prove identity for every question paper which the candidate appears at the examination.

9. Candidates with **special needs** should compulsorily fill the details requested under "Yes" of the icon "Are you a special needs candidate?".

10. **Special attention is drawn to:**

10.1. Examination fees paid for this examination will not be refunded fully/part thereof or transferred to any other examination fee.

10.2. **No applicant is permitted under any circumstances to change examination center after submitting applications. Therefore, it is advised to complete the application accurately.**

10.3. Applicants who applied for following subjects under second subject category should appear at the practical test as well. Candidates who fail to comply with this requirement will not be issued results irrespective of their sitting for the written test.

(40)- Music (Oriental)
(41)- Music (Western)
(42)- Music (Carnatic)
(44)- Dancing (Indigenous)
(45)- Dancing (Baratha)
(50)- Drama and Theatre (Sinhala)
(51)- Drama and Theatre (Tamil)
(52)- Drama and Theatre (English)

Please contact the following numbers or send an e-mail to the following e-mail address for any further clarification in this regard.

**E-mail address:** gceolexamsl@gmail.com
Tel : 011-2784208 / 011-2784537 / 011-2785922

**Online Unit**
Tel : 011-3671568 / 011-3661122

**H.J.M.C. Amith Jayasundara**
**Commissioner General of Examinations**

**Ref. No. 6/4/OL/2024**
**School Examinations Organization and Results Branch**
**Department of Examinations, Sri Lanka**
**P.O. Box 1503, Colombo.**

04.11.2024